**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු විගණන ගාස්තු රු.134,880 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගෙවියයුතු විශ්‍රාම වැටුප් රු.106,054 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු රු.265,292 ක දැන්වීම් පුවරු ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පිහිටි සුසාන භූමි 13 ක් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | අදාළ දැනුවත් කිරීම් සිදුකර පවරා ගැනීමට කටයුතු කරන බව. | සුසාන භූමි පවරා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත | | | |
| | (i) ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | සභා බල ප්‍රදේශයේ පිහිටි ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන වලින් 2015 සිට 2022 දක්වා අයවිය යුතු රු.5,554,900 ක ත්‍රීරෝද රථ ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිසි ක්‍රමවේදයකට අනුව අයකර ගැනීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා විධිවිධාන පරිදි අය කළ යුතුය. |
| | (ii) ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | ප්‍රචාරක දැන්වීම් පුවරු 75 කින් සමාලෝචිත වර්ෂය තුළදී රු.49,319 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | නොගෙවූ ගාස්තු සඳහා නීතිමය කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව. | අතුරු ව්‍යවස්ථා විධිවිධාන පරිදි අය කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | 2012 සිට 2020 කාල පරාසයට අදාළ රු.2,867,079 ක් වටිනා ඉකුත් තැන්පත් 89 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරිපත් නොවන තැන්පතු රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.43,900,990 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,623,148 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,151,936 | 3,359,800 | 5,889,272 | 4,743,864 | 3,363,599 | 3,187,281 | 3,189,469 | 7,273,336 |
| (ii) | කුලී | 2,475,925 | 6,674,473 | 6,625,286 | 1,445,897 | 1,840,710 | 4,656,702 | 4,553,006 | 1,396,710 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,203,765 | 2,400,556 | 1,762,856 | 5,554,900 | 2,225,365 | 2,182,133 | 1,765,633 | 4,917,200 |
| (iv) | වෙනත් ආදායම් | 51,043,879 | 51,923,097 | 58,256,724 | 89,634,452 | 49,491,590 | 57,209,320 | 48,195,539 | 95,968,079 |
| | | 58,875,505 | 64,357,926 | 72,534,138 | 101,379,113 | 56,921,264 | 67,235,436 | 57,703,647 | 109,555,325 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.4,094,822 ක් වූ අතර, ඒකකයක වරිපනම් හිඟය රු.5,000 ඉක්මවූ දේපල 114 කින් එකතුව රු.2,852,987 ක් විය. | දේපල තහනම මඟින් අය කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර ආදායම් අය කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.649,041 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවති අතර ඉන් රු.40,000 ක් ඉක්මවූ ඒකක 7 කින් රු.432,975 ක හිඟ ශේෂයක් විය. | දැනුවත් කිරීම් සිදු කර ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.15,517,372 ක් වූ අතර, ඒකකයක ජල ගාස්තු හිඟය රු.5,000 ඉක්මවූ ජල පාරිභෝගික ඒකක 456 කින් එකතුව රු.8,223,574 ක ජල ගාස්තු අයකර ගෙන නොතිබුණි. | හිඟ ශේෂ අය කිරීමටත් අයකරගත නොහැකි ශේෂ කපා හැරීමටත් සැලසුම් කර ඇති බව. | හිඟ ශේෂ අයකළ යුතුය. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,111,692 ක් හා මුද්දර ගාස්තු රු.73,005,388 ක් විය. | පළාත් භාණ්ඩාගාරය වෙත සිහිකැඳවීම් ලිපි වලට පිළිතුරු නොලද බව. | මුද්දර ගාස්තු හා උසාවි දඩ ගනේවා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කසළ කළමනාකරණ අංගනය සඳහා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබීමෙන් වන සතුන් කසළ ආහාරයට ගැනීම හේතුවෙන් වන සතුන්ට හා කාබනික පොහොර අංගනයට ඉන් හානිදායක තත්ත්වයක් උද්ගතව පැවතුණි. | වැටක් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇති බව. | දේපල හා පරිසරය ආරක්ෂා කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 (ආ) වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලී රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අදාළ සේවාව පවත්වාගෙන යාමට පහසුකම් සභාවේ නොමැති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.202,655 ක කර්මාන්ත ණයගැති ශේෂයක් පැවති අතර ඉන් වසර 5 කට වැඩි කාලයක් පවතින රු.150,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉල්ලීම් කළද මුදල් ප්‍රතිපූර්ණය නොවූ බව. | ලැබිය යුතු ශේෂයන් අයකළ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,190,466 ක වියදම් ණයහිමි ශේෂයක් පැවති අතර, ඉන් වසර 1 ත් 3 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.261,500 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වසර තුළ ගෙවීමට කටයුතු කරන බව. | ණයහිමි ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| (ඇ) | සභාබල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති 08 කට අදාළ ජල පාරිභෝගිකයින් 3600 ක් පමණ සිටියද ඉන් පාරිභෝගිකයින් 3,088 කට ජල මනු සවිකර නොතිබුණු අතර නිවැරදි ජල ගාස්තු අයවීමක් සිදුව නොතිබුණි. | වැලිගල් සිරවීම හේතුවෙන් ජල මනු අක්‍රීය වන බැවින් සවිකිරීම් ප්‍රමාද වී ඇති බව. | ජල මනු සවිකර නියමිත ගාස්තු අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.24,976,816 ක ඉඩම් කොටස් 15 කට අදාළව අයිතිය තහවුරු කරන හිමිකම් ඔප්පු, ප්‍රකාශන ඔප්පු, පැවරුම් නියෝග කිසිවක් ඉදිරිපත් නොවුණි. | මැනුම් කටයුතු කිරීමට අනුමැතිය ලැබී නොමැති බව හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඔප්පු ලබා දීම ප්‍රමාද කිරීම බව. | නීත්‍යානුකූලව අයිතිය පවරා ගත යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් වෙන්දේසි වලින් පොදු කටයුතු සඳහා සභාව වෙත පවරා තිබුණු රු.32,572,500 ක ඉඩම් කොටස් 9 ක් හා වටිනාකම් හඳුනාගැනීමට නොහැකි වූ ඉඩම් කොටස් 19 ක් පොදු කටයුතුවලට යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොමු කිරීමට කටයුතු කරන බව. | ඉඩම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව පරිහරණය කරන රු.4,950,000 ක එක් ගොඩනැගිල්ලක් ද වටිනාකම් ගණනය නොකල ගොඩනැගිලි 08 ක් හා ජල ව්‍යාපෘති 05 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී විධිමත්ව පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගත යුතුය. |

**3.4 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ මධ්‍යම පළාත් සංචාරක දෙපාර්තමේන්තුව මඟින් රු.6,070,538 ක් වැය කර ඉදිකර තිබුණු ලූල්කඳුර සංචාරක පහසුකම් මධ්‍යස්ථානය ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු පර්චස් 15 ක ඉඩමක ඉදිකර තිබුණි. එම ඉඩම සඳහා විධිමත් බදු ගිවිසුමක් සභාව සතුව නොතිබුණි. | අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | විධිමත්ව ගිවිසුම්ගත විය යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 10 ක පුරප්පාඩු 21 ක් ද තනතුරු 02 ක අතිරික්තතා 11 ක් ද පැවතුණි. | පුරප්පාඩු සම්බන්ධව දැනුවත් කර ඇති අතර අතිරික්තය සංවර්ධන නිලධාරීන් බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 04 ක සියයට 13 සිට සියයට 99 දක්වාද, වියදම් විෂයයන් 28 ක සියයට 33 සිට සියයට 97 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | සංවර්ධන ව්‍යාපෘතීන් සීමා කිරීම, ද්‍රව්‍ය මිල ඉහල යාම හා ආර්ථිකය කඩා වැටීම හේතු වූ බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය පිළියෙල යුතුය. |

### 4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |